# වත්මන් අර්බුදයේ දුටු නුදුටු පැති



සෝමවංශ අමරසිංහ සහෝදරයා



ටිල්වින් සිල්වා සහෝදරයා

## රටේ දේශපාලනය සහ ජ.වි.පෙ.

ප්‍රශ්නය :- කොටි සංවිධානය පැරදවීමට සටන් කරන රාජපක්‍ෂ ආණ්ඩුව රට පාවාදීමට හෝ බෙදුම්වාදය දිනවීමට කටයුතු නොකරන බවට තර්කයක් තිබෙනවා. ඒ ගැන ඔබේ අදහස කුමක්ද?

ටිල්වින් සිල්වා සහෝදරයා : වැදගත්කම තියෙන්නෙ බොරු තර්කවල නෙවෙයි. ප්‍රායෝ-ගිකව ඇත්තටම සිදුවන දේ තුළයි. කොටි පැරදවීමේ සටන රාජපක්‍ෂ ආණ්ඩුව විසින් කරගෙන යන බව ඇත්ත. එහි ගෞරවය ලැබිය යුත්තේ මහින්ද රාජපක්‍ෂ ආණ්ඩුවට විතරක් නෙවෙයි.මේ සඳහා ආණ්ඩුවට බලපෑම් කරමින්, ජනතා මතය සකස් කරමින් සන්නද්ධ හමුදා දිරිමත්කරමින් පරිසරය සකස් කළේ ජනතා විමුක්ති පෙරමුණයි. ඒ වගේම මේ රටේ දේශප්‍රේමී ජනතාව යුද්ධය සඳහා ලබාදුන් සහය අතිවිශාලයි. විශේෂම කරුණ කොටි පැරදවීම සඳහා සන්නද්ධ හමුදා තුළ තිබෙන උවමනාව, කැපවීම හා සටන්කාමීත්වයයි. ඒ නිසයි මේ යුද්ධයජය ලබමින් ඉදිරියට යන්නෙ.

ඒත් දැන් ආණ්ඩුව මෙම යුද්ධය ආවරණයක් කරගනිමින් රට පාවා දෙමින් ඉන්නවා. එය හංගන්න බැහැ. ඒක තමයි ඇත්ත. අද රාජපක්‍ෂ පාලනය ඉන්දියාව ඉදිරියේ දණ ගහලා, නිවට වෙලා ඉන්දියානු උවමනාව අනුව අපේ ආර්ථික හා දේශපාලන කටයුතු හසුරුවනවා.මේ කරුණු අපි කලිනුත් පැහැදිලි කළා. ඒත්, මෙහිදීත් සඳහන් කළ යුතු වෙනවා. සන්නද්ධ හමුදා සටන් කොට මුදාගත් නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වර්ග කිලෝමීටර් 675ක භූමියක් ආර්ථික කලාපයක් ලෙස ඉන්දියාවට දෙනවිට ඒක පාවාදීමක් නෙවෙයිද? අපේ මව්බිම, අපේ මහපොළොව මෙතරම් ප්‍රමාණයක් ඉන්දියාවට දෙන්නේ ඇයි? ඒ භූමියේ ජනයා අනාථ කඳවුරුවල දුක් විඳින අතර ඒ ජනයාට අයත් භූමිය ඉන්දියාවට ලබාදීලා තියෙනවා. අපේ රටේ මුහුදුබඩ තිබෙන වටිනා ඛණිජ සම්පත් ඉන්දියාවට දෙනවා. මන්නාරම් ද්‍රෝණියේ තෙල් ගොඩගැනීම ඉන්දියාවට පවරනවා. කන්කසන්තුරේ සිමෙන්ති කම්හල ඉන්දියාවේ බිර්ලා සමාගමට දෙනවා. මේ කරුණු අපි කලිනුත් පැහැදිලි කළා. මුහුදුබඩ දුම්රිය මාර්ගය ඉදිකිරීමත් ඉන්දියාවට දෙනවා. ඒ සියල්ලට වඩා බරපතල ලංකාවේබලශක්තිය (විදුලිය හා තෙල්) හැසිරවීමේ බලය ඉන්දියාවට දෙමින් සිටීමයි. එය ජාතික ආරක්‍ෂාවටත් තර්ජනයක්. ඉතිං මෙය පාවාදීමක් නොවෙයිද? දේශප්‍රේමී ජනයාගේ සහාය මැදමහා කැපකිරීම් කරමින් සන්නද්ධ හමුදා කොටින්ගෙන් මුදාගන්නා උතුරු නැගෙනහිර සම්පත් හා භූමිය කුමානුකූලව ඉන්දියාවට ලබාදීම පාවාදීමක් විතරක් නෙවෙයි ද්‍රෝහීකමකුත්වෙනවා. ඒ ද්‍රෝහීකම මේ ආණ්ඩුව කරනවා.

අනික් අතට ත්‍රස්තවාදය පැරදවීමට කටයුතු කරන ආණ්ඩුව බෙදුම්වාදයට පණ දෙමින් ඉන්නවා. කොටින්ගෙන් මුදාගත් නැගෙනහිර පළාතේ කඩිමුඩියේ පළාත් සභා පිහිටුවා පිල්ලෙයාන් මහඇමති කළා. මේ ආරම්භ කරල තියෙන්නෙ බලය බෙදීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම නොවෙයිද? මේ වැඩේ කරන්නෙත් ඉන්දියාවේ බලපෑමට යටවෙලා බවයි, සත්‍යය. දැන් පොදුවේ පළාත් සභාවලට බලතලදීමේ යෝජනා සම්මත කරමින් නැගෙනහිර පළාතට පොලිස්, ඉඩම් බලතල ඇතුළු උපරිම බලතල ලබාදීමට ක්‍රියාකරමින් ඉන්නවා. උතුරු පළාතට අන්තර් පළාත් සභාවක් පත්කිරිමට සූදානම් වෙනවා. අද ඉන්දියාවට අවශ්‍යවෙලා තියෙනවා, උතුරු හා නැගෙනහිර පළාත්වල ඉන්දියානු රූකඩ පාලනයක් හදාගන්න. දැනටමත් නැගෙනහිර පළාතේ එය ඉටුවෙලා ඉවරයි. පිල්ලෙයාන් ඉන්දියානු රූකඩයක්වීම වැළැක්විය නොහැකියි. ඊළඟට උතුරු පළාත මුදා ගතහොත් එහිද ඉන්දීය රූකඩයක් විසින් පාලනය කරන සභාවක් ඒවි. ඉන්පසු එම පළාත් සභා දෙක යළි එකතු වේවි. ඒවාට ඉඩම් බලතල, පොලිස් බලතල ආදී උපරිම බලතල ලබාදේවි. එවිට ජයගන්නේ, බෙදුම්වාදය මිස අන් කවරක්ද? 1987 ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කරලා දේශප්‍රේමී ජනතාව-ගේ වීරත්වය නිසා ඉටුකර ගැනීමට නොහැකි වූ කාර්යය දැන් ඉන්දියාව දේශප්‍රේමී" මහින්ද රාජපක්‍ෂ ලවා ඉටුකරවා ගනිමින් ඉන්නවා. පසුගිය කාලයේ පළාත් සභා මහ ඇමතිවරුන්ගේ සමුළුව අනුරාධපුරයේ පවත්වා එහි සභාපති තනතුර පිල්ලෙයාන්ට භාරදී එම සමුළුවේදීම පළාත් සභාවලට වැඩි බලතල දීමේ යෝජනාවක් සම්මත කරගනු ලැබුවේ ජනාධිපතිවරයාගේ අවබෝධය සහිතව නේද? දැන් ඊනියා සර්ව පාක්‍ෂික කමිටු තුළ තිස්ස විතාරණ ඇමතිවරයා මගින් ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට ෆෙඩරල් සංශෝධන ඇතුල් කිරීමට සැලසුම් සකස් කරමින් ඉන්නේ ජනාධිපතිතුමා නොදැනුවත්වද? නැහැ. එය මහින්ද රාජපක්‍ෂ මහතා දැනුවත්වම කරමින් සිටිනදෙයක්. එය 2005 ජනවරම ද උල්ලංඝනය කිරීමක්. ඒ නිසා මහින්ද රාජපක්‍ෂ මහතා කොටි පරදන සටන ආවරණයක් කොටගෙන රට පාවාදීමේත්, බෙදුම්වාදී (බලය බෙදීම) පියවර ගැනීමේත් යෙදී සිටින බව ඉතා පැහැදිලියි. ඒ වෙන කිසිවක් සඳහා නොවෙයි. තම බලය රැකගැනීම හා දිගු කලක් බලයේ සිටීමේ ආශාව පෙරදැරි කරගෙනයි. ඒ සඳහා ඉන්දියාවට අවනතව වැඩකිරීමට ඔහුට සිදු වී තිබෙනවා.

ඒ විතරක් නෙවෙයි, පළාත් සභා මැතිවරණ ප්‍රචාරක රැස්වීමකදී ආණ්ඩුවේ ඇමතිවරයෙක් වන ලක්‍ෂමන් යාපා අබේවර්ධන මහතා කළ කතාවක් පසුගිය අගෝස්තු 01වැනිදා රාත්‍රී එක්තරා රූපවාහිනී නාලිකාවකින් ප්‍රචාරය කළා. එහිදී ඔහු කිව්වේ කුමක්ද? ප්‍රභාකරන් අවි බිම තබා ප්‍රජාතන්ත්‍රවාදයට එන්නේනම් ප්‍රභාකරන්ට උතුරු පළාතේ මහ ඇමතිකම දීමටආණ්ඩුව සූදානම් බව ඔහු ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශය තුළ තියෙන්නේ මෝඩකම පමණක් නෙවෙයි ආණ්ඩුවේ අධිපතිවාදී උද්දච්චකමත් තියෙනවා. මේ අනුව උතුරු පළාතේ මහ ඇමතිතෝරාපත්කර ගන්නේ උතුරු පළාතේ ජනතාව නොවෙයි. ආණ්ඩුවයි පත් කරන්නේ. ඒ අයිතිය ආණ්ඩුවට ආවේ කොහොමද? එතකොට උතුරට ප්‍රජාතන්ත්‍රවාදය කෝ? නැගෙනහිර වගේම තමන්ට කැමති කෙනෙක් මහ ඇමති කරන බව නේද මේ කියන්නේ. මෙහි තවත් ප්‍රශ්නයක් තියෙනවා. කොටුව බැංකු මූලස්ථානයට එල්ල කළ ප්‍රහාරය පිළිබඳ නඩුවේදී කොළඹ මහාධිකරණය ප්‍රභාකරන්ට අවුරුදු දෙසීයක සිරදඬුවමක් නියම කරල තියෙනවා. එහෙම හිර දඬුවම් ලැබූ කෙනෙක් මහඇමති කරන්න ආණ්ඩුවට පුළුවන්ද? නැතිනම් ප්‍රභාකරන් සිර දඬුවමකට ලක් වූ පුද්ගලයෙක් බව පවා දැන් ආණ්ඩුවට අමතක වෙලාද? මේ සියල්ලෙන් පැහැදිලි වෙන්නේ අන් කිසිවක් නොවෙයි. ආණ්ඩුව එක් අතකින් ඉන්දියාවට යටවෙලා. අනික් අතින් යුද්ධ ජයග්‍රහණ වලින් මත්වෙලා, හිස උදුම්මා ගෙන වැරදි තීරණ ගනිමින් රට පාවාදීමටත් බෙදුම්වාදය සවිමත් කිරීමටත් කටයුතු කරන බවයි.

ප්‍රශ්නය :- ඔබේ පක්‍ෂයේ විග්‍රහයට අනුව මහින්ද රාජපක්‍ෂ පාලනය ගමන් කරමින් තිබෙන්නේ කුමන දිශාවකටද?

සෝමවංශ අමරසිංහ සහෝදරයා : මහින්ද රාජපක්‍ෂ ජනාධිපතිවරයා මේ වන විට තමන්ට ලැබුණ ජනවරමට පිටුපා යමින් ඉන්නවා. පළමුකොටම, රාජපක්‍ෂ මහතා ශ්‍රී ලංකාවේ ඒකීය රාජ්‍යය ආරක්ෂා කරාවිද? නැද්ද? යන ප්‍රශ්නය විසඳා ගත යුතුයි. 2005 රාජපක්ෂ මහතාට ලැබුණු ජනවරම ඉතා පැහැදිලි එකක්. එදා සටන පැවතුණේ ඒකීය රාජ්‍යය වෙනුවෙන් පෙනී සිටි කඳවුර හා ඒකීය රාජ්‍ය අහෝසි කර සන්ධීය ක්‍රමය ස්ථාපිත කළ යුතුයයි කියන කඳවුර අතරයි. ඒ සටනින් ඒකීය රාජ්‍යයි වෙනුවෙන් පෙනී සිටි කඳවුර ජයග්‍රහණය කළා. ඒ නිසා රාජපක්ෂ මහතා ඒකීය රාජ්‍යයි ආරක්ෂා කළ යුතුයි. ඒක වගකීමක්. ඒ වගකීමට පිටුපාන්න රාජපක්ෂ මහතාට කිසිදු ඉඩක් නැත්තේ, මේ රටේ ජනතාව අතරින් බහුතරය රාජපක්ෂ මහතා ජනාධිපති ලෙස තෝරා ගත්තේ ප්‍රධාන වශයෙන්ම ඒකීය රාජ්‍ය ආරක්ෂා කරන්න නිසයි. නමුත් රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවේ වගකිව යුතු ඇමතිවරු ශ්‍රී ලංකාවේ සන්ධීය ක්‍රමයක් ස්ථාපිත

34 වන පිටුවට

**ජනතා විමුක්ති පෙරමුණ,**
**ජාත්‍යන්තර අංශය, ඕස්ට්‍රේලියාව**

**මහ බැංකු වාර්තාවලට අනුව පසුගිය අයවැයේ සිට 2008 පෙබරවාරි වනවිට එකතු කරගෙන තිබෙන ලංකාවේ රාජ්‍ය ආදායම රුපියල් බිලියන 102.9ක්. ඉන් රුපියල් බිලියන 97.5ක් ම බදු ආදායම්. බදු නොවන ආදායම් තිබෙන්නෙ රුපියල් බිලියන 5.3ක් තරම් සුළු ප්‍රමාණයක්. ඉතිං මේ ණය හා බදු මත යැපෙන ආර්ථික රටාව වෙනස් කළ යුතුයි. ඒ වෙනුවට ශක්තිමත් ජාතික ආර්ථිකයක් නිර්මාණය කළ යුතුයි. රටේ සියලු නිෂ්පාදන ශක්තීන් එක්රැස් කර ජාතික වුවමනාවන්ට ප්‍රමුඛතාවය දෙමින් එහෙත් ලොව දියුණුම තාක්‍ෂණය, දැනුම හා සාධාරණ එකඟතා මත විදේශ ආයෝජන යොදාගනිමින් ආර්ථිකය සංවර්ධනය කළ යුතු වෙනවා. එම ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ පවුල් කිහිපයක් අතට නොව සමස්ත සමාජයටම සාධාරණ ලෙස බෙදීයන ක්‍රමයක් සකස් කළ යුතු වෙනවා.**


# GATEWAY LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila